


# e දකුණු ආසියානු රාජ්‍යය කිරුළ ලංකාවට

**ටී.එම්.ජී. චන්ද්‍රසේකර**



එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ධරණීය සංවර්ධනය පිළිබඳ 2020 ඉ-රාජ්‍යය සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍යය සංවර්ධන කටයුතු පසුගිය දෙවසර තුළ වඩාත් දිරිගන්වන සුලු ලෙස ඉදිරියට පැමිණ තිබෙනවා. එය සනාථ කරමින් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193 ක් අතරින් 94 වැනි ස්ථානයේ සිට 85 වැනි ස්ථානය දක්වා පැමිණීමට අපට හැකිව තිබෙනවා. උපකලාපීය වශයෙන් ගත් විට ශ්‍රී ලංකාව සිටින්නේ දකුණු ආසියාවේ ප්‍රමුඛ ස්ථානයේ.

2020 ඉ - රාජ්‍යය සමීක්ෂණ වාර්තාවට අනුව සියලු රටවල් අතරින් ප්‍රමුඛ තැනට පැමිණ ඇත්තේ ඩෙන්මාර්කය යි. පිළිවෙළින් මහජන කොරියාව, එස්තෝනියාව, ෆින්ලන්තය, ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, එක්සත් රාජධානිය, නවසීලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, නෙදර්ලන්තය, සිංගප්පූරුව, අයිස්ලන්තය, නෝර්වේ, ජපානය යන රටවල් ඉදිරියෙන් සිටිනවා. භූතානය, බංගලාදේශය, කාම්බෝජය යන රටවල් ඉ- රාජ්‍ය ක්‍රියවලියෙන් ඉදිරියට පැමිණ ඇති අනෙකුත් රටවල් ලෙස සඳහන්.

එක්සත් ජාතින්ට අනුව ඉ-රාජ්‍යය වර්ධනය රටක සංවර්ධනය පෙන්වන දර්ශකයක්. ඉ-රාජ්‍යයක් යනු රජයක මූලික වගකීම් වන පුරවැසියන්ට භාණ්ඩ හා සේවා සැපයීම, නීතිය හා සාමය රැකීම, විදේශ කටයුතු, ආරක්ෂාව, සුබසාධනය ආදිය වඩාත් ප්‍රතිපලදායක අයුරින් ඉටුකිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගැනීමේ ක්‍රමවේදය යි. ලෝක බැංකුව මෙය අර්ථ දැක්වූයේ 'පුරවැසියන්, ව්‍යාපාරික ප්‍රජාව හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ ඇති සබඳතාව ධනාත්මක ව වර්ධනය කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීම' යනුවෙන්. මෙරට එම කටයුතු සිදු කරන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) අර්ථ දැක්වීමට අනුව ඔවුන් මෙහිදී ඉ-රාජ්‍ය සංවර්තන ක්‍රියාවලියට අදාළ මූලෝපායයික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම තුළින් රාජ්‍ය අංශය වඩාත් ඵලදායී හා පුරවැසි හිතකාමී ලෙස රාජ්‍ය සේවාවන් ඉලෙක්ට්‍රොනිකව ලබා දීමට ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම සඳහා කටයුතු කරනවා.

මේ වන විටත් ක්‍රියාවට නංවා ඇති රාජ්‍ය අංශයේ ඉ- සේවා හා රාජ්‍ය බිහිදොර වැනි අන්තර්ජාල සේවාවල වර්ධනය මේ ඇගයීමට හේතු වී තිබෙනවා. මේ සමීක්ෂණ වාර්තාව සැකසිමේදී ඒ ඒ රටවල , ඉ - රාජ්‍ය ක්‍රියාවලිය පිළිබඳ පුළුල්ව සලකා බැලීම සුවිශේෂයි. ඊට එම රටවල් දක්වන උන්දුව ද වැදගත්. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මේ සඳහා විශේෂ කාර්යසාධක බලකායක් පිහිටුවා, සියලුම රාජ්‍ය අංශවල සම්බන්ධිකරණයෙන් තොරතුරු එක්රැස් කිරීම, නිල වෙබ් අඩවි යාවත්කාලින කිරීම වැනි දත්ත සැපයීම නිසා ඉ- රාජ්‍යය ක්‍රියාවලියෙහි සැබෑ ස්වරූපය තහවුරු කර ගැනීමට එමඟින් අනුබලයක් ලැබී තිබුණා.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ ආර්ථික හා සාමාජික සංවර්ධන අංශය මේ ඇගයුම් සඳහා මූලික උපමාන දර්ශක කීපයක් විමර්ශනයට ලක් කරනවා. ඒ අනුව මානව සම්පත් දර්ශකය, විදුලි සංදේශන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් දර්ශකය, අන්තර්ජාල සේවා දර්ශකය යන අංශ තුනෙන් ම ශ්‍රී ලංකාව ඉහළම තැනක සිටිනවා. එවැනි ඉහළම අගයක් ලැබූ දකුණු ආසියානු රටවල් අතරට ශ්‍රී ලංකාව ද අයත්. එය අප ලැබූ වටිනා අන්තර්ජාතික දර්ශකයක්. ඉන්දියාව හා බංගලාදේශය විදුලි සංදේශන ක්ෂේත්‍රයේ වර්ධනයේ සිටින්නේ මධ්‍ය තැනක. ලෝකයේ අනෙක් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ ඇත්තේ අඩුම දුරකථන